**ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සහ එහි පරිපාලිත සම්ගම් ඇතුලත් සමූහය - 2020**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සහ එහි පරිපාලිත සමාගම් ඇතුලත් සමූහයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශන, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර අධිකාරිය සහ එහි පරිපාලිත සමාගම් ඇතුලත් සමූහයේ මූල්‍ය ප්‍රකාශන තුලින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අධිකාරිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව,

- යම් අදාල ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව සමාගම ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාල නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය**

ගණුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාල වන වාර්තාකරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගණුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම් කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගනීමට ප්‍රමාණවත් " මනා ලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

**1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල නොවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | අදාල ප්‍රමිතයට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධිකාරිය විසින් කිලෝ මීටර් 8, 708 ක් වූ ඇල මාර්ග රු. 74,989,140,000 කට මුල් වරට ස්ථාවර වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කර තිබුණද ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 ප්‍රකාරව එම ඇල මාර්ග තක්සේරු කළ ආකාරය සහ ඊට අදාල ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. එම ඇල මාර්ග ස්ථාවර වත්කම් ලේඛණයටද ඇතුලත් කර නොතිබුණි. | ඇළ මාර්ග වල ප්‍රත්‍යාගණන වටිනාකම "දේපළ පිරියත හා උපකරණ" යටතේ මූල්‍ය ප්‍රකාශනයේ ඇතුළත් කර ඇති අතර මේ සම්බන්ධ ගිණුම්කරණ ප්‍රතිපත්තිය සටහන් අංක 3.2 මඟින් නිරූපණය කර ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව ඇල මාර්ග තක්සේරු කළ ආකාරය සහ ඊට අදාල ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කළ යුතු අතර ස්ථාවර වත්කම් ලේඛණයේ සටහන් කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ප්‍රකාරව රාජ්‍ය අංශයේ යටිතල පහසුකම් සංවර්ධන වත්කම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වුවත් අධිකාරිය විසින් නඩත්තු කරන ප්‍රධාන වේලි 12 ක් සහ වැව් 463 ක් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | අධිකාරිය විසින් නඩත්තු කරන ප්‍රධාන වේලි 12 හා වැව් 463 හි අයිතිය පිළිබඳ පුළුල්ව පරීක්ෂා කර ඒවා වෙනත් දෙපාර්තමේන්තු, සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතන වල යම් හිමිකාරිත්වයක් මත අවසන් ගිණුම්වල ස්ථාවර වත්කම ලෙස පෙන්වා ඇත්දැයි පරීක්ෂා කර බලා | අධිකාරිය සතු වත්කම් ගිණුම් ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ඉදිරියේදී ගිණුම් ගත කිරීමට කටයුතු කරනු ඇත. | |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 47 ඡේදය ප්‍රකාරව සාධාරණ වටිනාකම සැලකිය යුතු තරම් වෙනස්වන හා ඉක්මනින් වෙනස්වීම්වලින් යුක්ත වන වත්කම් ප්‍රත්‍යාගණනය කර සාධාරණ වටිනාකම ගිණුම්ගත කළ යුතු වුවත්, අධිකාරිය විසින් 1984-1989 කාලයේදී මිලදීගෙන තිබුණු පිරිවැය රු.64,320,853 ක් වූ ඉඩම් කට්ටි 02 ක් සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණු අතර ඒවායේ පිරිවැය හෝ ගිණුම්ගත කර නොතිබුණි. එසේම අධිකාරිය විසින් සිය කලාප කාර්යාල, අංශයන්, නිල නිවාස සහ සංචාරක බංගලා ආදිය පිහිටි ඉඩම් හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | එම ඉඩම් කට්ටි 2 අදාළ තක්සේරු වාර්තා ලබා ගැනීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. එම තක්සේරු කටයුතු සඳහා ලබාදීමට අධිකාරියට ඉඩමේ අයිතිය පිළිබඳ තහවුරු ලිපි (ඔප්පු) ඉදිරිපත් කිරීමට නොහැකි වීම හේතුවෙන් අදාළ තක්සේරු වාර්තා මෙතෙක් ලබා ගැනීමට නොහැකි වී ඇත. එබැවින් අදාළ ඔප්පු පිටපත් ලබාගෙන 2021 වර්ෂයේ ගිණුම් ගත කිරීමට කටයුතු කරන බව දන්වමි. | අධිකාරිය සතු වත්කම් ගිණුම්ගත කළ යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීමේ වියදම්වලින් ජනිත වන ප්‍රාග්ධන ස්වභාවයේ වත්කම් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුන්වාදී නොතිබුණු අතර ප්‍රධාන වේලි හා ජලාශ මෙහෙයුම් අංශයේ රු. 15,023,938 ක අයහාර වියදම් පුනරුත්තාපන හා වැඩිදියුණු කිරීමේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. මෙම නිසා වර්ෂයේ ඌනතාවය එම ප්‍රමාණයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | ජ’නල් සටහනක් මඟින් නිවැරදි කිරීමට කටයුතු කර ඇත. | පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීමේ වියදම්වලින් ජනිත වන ප්‍රාග්ධන ස්වභාවයේ වත්කම් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුන්වාදිය යුතුය. |

**1.5.4 ගිණුම්කරණ අඩුපාඩු**

-----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2015 – 2018 කාලය තුළ රු. 80,000,000 ක වියදමින් වැලිකන්ද සහ වැලිඔය කලාපවල ඉදිකර තිබුණු ජලපිරිපහදු යන්ත්‍රාගාර 30 ක් ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට වියදම් ලෙස කපා හැර තිබුණි. ඒ හේතුවෙන් වර්ෂයේ ඌනතාවය එම ප්‍රමාණයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. එසේම ඒවායේ පරිපාලන කටයුතු ගිවිසුම්ගත වීමකින් තොරව ගොවි සංවිධාන වෙත ලබා දී තිබුණි. | අධිකාරියේ ප්‍රතිපාදන මත ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව හා එක්ව මහවැලි බී හා එල් කලාප වල ප්‍රති ආශ්‍රිත ජල පිරිපහදු යන්ත්‍ර 30 ක් රු මි. 80 ක වියදමින් ස්ථාපිත කරන ලද අතර එම යන්ත්‍ර ප්‍රජා මූල සංවිධාන වෙත විධිමත් ලෙස භාර දී (බැහැර කර) ඇත. එවායේ නඩත්තු හා පරිපාලන කටයුතු මහවැලි අධිකාරියේ අධික්ෂණය මත එම ප්‍රජාමූල සංවිධාන විසින් සිදුකරනු ලබයි. ඒ අනුව මෙම පිරිවැය වැය ශීර්ෂ 2815 යටතේ වියදමක් ලෙස අවසන් ගිණුම් වලට ඇතුළත් කර ඇත. | ප්‍රාග්ධන වියදම් ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) වෙලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතියෙන් අධිකාරිය වෙත පවරා තිබුණු පිරිවැය රු. 671,503,748 ක් වූ ස්ථාවර වත්කම් කොටසක් රු.537,950,118 කට ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගතකර තිබුණද ඉතිරි රු.13,355,630 ක වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කර නොතිබුණි. මෙම වත්කම් සහ මොරගහකන්ද ව්‍යාපෘතිය විසින් පවරා දී තිබුණු රු.31,764,287,274 ක් වටිනා මොරගහකන්ද ජල විදුලි බලාගාරවලට අයත් වත්කම් ප්‍රදානයක් ලෙස ගිණුම්ගත නොකර ණයහිමියන් ලෙස ගිණුම්ගත කර තිබුණි. මෙම නිසා අධිකාරියේ ජංගම වගකීම් සහ ශුද්ධ වත්කම් පිළිවෙලින් රු.32,302,237,392 වැඩියෙන් හා අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | මෙතෙක් ගිණුම් ගතකර නොමැති වත්කම් වල වටිනාකමෙන් රු.12,561,000 වටිනා වත්කම් මොරගහකන්ද ව්‍යාපෘතිය වෙත භාර දී ඇති අතර එම වත්කම් එම ව්‍යාපෘතියේ ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුළත්ව ඇත. තවද මෙම වත්කම් ව්‍යාපෘතිය මඟින් භාරදීමේ දී විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර නොමැති වීම හේතුවෙන් ඉතිරිව පවතින වත්කම් ගිණුම්ගත කිරීමට අදාළව ගැටළු පවති. එම ගැටළු නිරාකරණය කර මුළු වටිනාකම "ප්‍රදානයක්" ලෙස 2021 වර්ෂයේ ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලබන බව දන්වමි. මොරගහකන්ද ව්‍යාපෘතිය මේ වන විටත් සක්‍රියව පවතින ව්‍යාපෘතියකි. | වත්කම් විධිමත් පරිදි භාරගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

මෙම ව්‍යාපෘතිය මඟින් රු.31,764,284,274 ක් වටිනා මොරගහකන්ද ජල විදුලි බලාගාරය අධිකාරියට පවරා දෙන විට මොරගහකන්ද ව්‍යාපෘතියේ ගිණුම්වල ස්ථාවර වත්කම් ගිණුමෙන් ඉවත් කර "ණයගැතියන්" ලෙස පෙන්වා ඇති අතර ව්‍යාපෘතිය සක්‍රියව පවතින බැවින් අධිකාරිය විසින් ඊට සමගාමීව එය "ණයහිමියන්" ලෙස පෙන්වා ඇත. ව්‍යාපෘතිය අවසන් වන දිනයකදී ව්‍යාපෘති ගිණුම් වල ආදායමට/ අරමුදලට එරෙහිව කපාහැරීම් සිදු කරන්නේ නම් එවිට "ප්‍රදානයක්" ලෙස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන වල පෙන්විය හැකි බව දන්වමි.

### 1.5.5 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මහවැලි පශු සම්පත් සහ කෘෂි ව්‍යාපාර (පුද්ගලික) සමාගම සහ මහවැලි උපදේශක සේවා කාර්යාංශය (පෞද්ගලික) සමාගම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2021 ජූලි 01 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. මෙම නිසා අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන එම සමාගම්වල මූල්‍ය ප්‍රකාශන සමඟ ඒකාබද්ධ කිරීමේදී විගණනය නොකළ මූල්‍ය ප්‍රකාශන පදනම් කරගෙන ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණි. | අධිකාරිය සිය පරිපාලිත සමාගම්වල ගිණුම්, ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමේදී සෑම වර්ෂයකම විගණනය නොකළ ගිණුම් උපයෝගී කරගෙන ඇත. පරිපාලිත සමාගම් ද සෑම වර්ෂයකම පෙබරවාරි 28 දිනට ප්‍රථම සිය මූල්‍ය ප්‍රකාශන විගණනය වෙත ඉදිරිපත් කළ යුතු නිසා එම මූල්‍ය ප්‍රකාශන විගණනය කර විගණිත මූල්‍ය ප්‍රකාශන පදනම්ව ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කලහොත් සෑම වසරකම පෙබරවාරි 28 වන දිනට ප්‍රථම ව්‍යවස්ථාපිත අවශ්‍යතාවය මත ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර විගණනය වෙත ඉදිරිපත් කළ නොහැකි වේ. කෙසේ නමුත් සී/ස මහවැලි පශු සම්පත් සහ කෘෂි ව්‍යාපාර (පුද්ගලික) සමාගම 2021 පෙබරවාරි 24 දින එම සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහිතවද සී/ස මහවැලි උපදේශක සේවා කාර්යංශය (පෞද්ගලික) සමාගම එම සමාගමේ පැවති නෛතික ගැටළු කිහිපයක් විසඳා ගැනිමෙන් පසු සිය අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහිතවද සිය වාර්ෂික මූල්‍ය | ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී අදාල පරිපාලිත සමාගම්වල මූල්‍ය ප්‍රකාශන සමඟ නියමිත දිනට විගණනය වෙත ඉදිරිපත් කළ යුතුය. |

ප්‍රකාශන විගණනය වෙත ඉදිරිපත් කර තිබුණි.

### 1.5.6 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂයය | | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | | රු. | | | |
| (අ) | ආයෝජන | 20,477,000 | කොටස් සහතික | මේ පිළිබඳ සොයා බලා ඉදිරියේ දී ඉදිරිපත් කිරිමට කටයුතු කරමි. | අදාල ශේෂ සනාථ කිරීම් විගණනයට ඉදිරිපත් කළයුතුය. |
| (ආ) | ඉතිරි කිරීමේ ගිණුම | 2,632,908 | ශේෂ සනාථන සහ පාස්පොත | -එම- | -එම- |
| (ඇ) | ස්ථාවර තැන්පතු | 727,481 | තැන්පත් සහතික ශේෂ සනාථන | -එම- | -එම- |

## 1.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මහවැලි අධිකාරිය විසින් ක්‍රියාත්මක කරන ණය වැඩසටහන් යටතේ අධිකාරිය විසින් නිර්දේශ කරන ජනපදිකයින්ට ණය ලබා දීම සඳහා ප්‍රාදේශීය සංවර්ධන බැංකුව වෙත ලබා දී තිබුණු මුදලින් රු. 150,703,811 ක ණය නිකුත් කර තිබුණද ඊට අදාල එක් එක් ණයගැති ශේෂයන් සහ කාල විශ්ලේෂණයක් මූල්‍ය ප්‍රකාශනවල සටහන් මඟින් හෙළිදරව් කර නොතිබුණි. | 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනය සමඟ එක් එක් ණයගැති ශේෂයන් සහ කාල විශ්ලේෂණය හෙළිදරව් කිරිමට කටයුතු කරමි. | නිකුත් කර ඇති සමස්ත ණය මුදලට අදාල එක් එක් ණයගැති ශේෂ ලැයිස්තුවක් සහ ණයගැති කාල විශ්ලේෂණයක් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ III පරිච්ඡේදයේ 3.8.2 වගන්තිය | එක් එක් ගණයට අයත් කාර්ය ස්ථානයක සේවය කළයුතු උපරිම කාලපරිච්ඡේදය නියම කළයුතු වුවත්, අධිකාරියේ මාරු මණ්ඩල විසින් සකස් | ස්ථාන මාරු ක්‍රියා පටිපාටිය අනුව වාර්ෂික ස්ථාන මාරු 2020 හා 2021 වර්ෂවලදී පවතින වසංගත තත්වය මත සිදු කිරිමට නොහැකි වුවද මේ වන විට ආරක්ෂක හටයින් සුදුසු පරිදි අභ්‍යන්තර | ආයතන සංග්‍රහයට අනුකූලව අධිකාරියේ මාරුකිරීම් පටිපාටිය |

| | | | | |
|---|---|---|---|---|
| | | කරනු ලබන්නා වූ මාරු කිරීමේ පටිපාටිය තුළ එපරිදි උපරිම කාලපරිච්ඡේදයක් නියමකර නොතිබුණි. ඒ හේතුවෙන් විගණිත දිනය වූ 2021 පෙබරවාරි 02 වන විට මහවැලි ආරක්ෂක බළකාය තුළ සිවිල් කාර්ය මණ්ඩලයේ සේවකයින් 11 දෙනෙකු අවුරුදු 05 කට වැඩි කාලයක්ද, සේවකයින් 13 දෙනෙකු අවුරුදු 10 ට වැඩි කාලයක්ද, 06 දෙනෙකු අවුරුදු 20 ට වැඩි කාලයක්ද සේවය කරමින් පැවතුණි. | වැඩ පිළිවෙලක් තුළ ස්ථාන ගත කර ඇත. එසේම සිවිල් කාර්ය මණ්ඩලය ද අදාළ පරිදි ස්ථාන ගත කිරීමට කටයුතු කරමි. | සකස් කරගත යුතුය. |
| (ආ) | 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය | මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණනය වෙත ඉදිරිපත් කළ යුතු වුවද සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. | 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කිරීමට සටහන් කර ගතිමි. | මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව චක්‍රලේඛ නියමයන්ට අනුව විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලයේ 2018 දෙසැම්බර් 31 දින නිකුත් කර තිබූ මූල්‍ය නොවන වත්කම් තක්සේරුකිරීම් මාර්ගෝපදේශය | | | |
| | (i) 2.1 **ඡේදය** | රජයට අයත් සියලුම ඉඩම් තක්සේරු කිරීම අත්‍යාවශ්‍ය වන අතර, එහිදී රජයේ කාර්යාල, නිවාඩු නිකේතන, වැඩපලවල් ආදිය පිහිටා ඇති රජයේ ඉඩම් තක්සේරු කර ගැනීමට ප්‍රමුඛතාවය ලබාදිය යුතු වුවද, | ඉඩම්, රජයේ ඉඩම් වන අතර කළමනාකරණය හා පරිපාලනය සඳහා පමණක් අධිකාරිය වෙත බලය පවරා ඇත. ඒ අනුව අධිකාරිය සඳහා ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශ කර ඇති බල ප්‍රදේශයේ පවතින ඉඩම්වල මහවැලි අධිකාරියේ කාර්යාල | චක්‍රලේඛ නියමයන්ට අනුව අධිකාරියේ කටයුතු සඳහා භාවිතා කරන රජයේ ඉඩම් |

| | | | | |
|---|---|---|---|---|
| | | අධිකාරියේ කාර්යාල, නිවාඩු නිකේතන හා වැඩපලවල් ආදිය පිහිටි ඉඩම් තක්සේරු කිරීමට කටයුතු කර නොතිබුණි. | පරිශ්‍ර පවත්වාගෙන යාම, සේවා සැපයීමට අවශ්‍ය ගොඩනැගිලි ඉදිකිරීම සහ ප්‍රජාවගේ සංවර්ධන කටයුතු සඳහා ඉඩම් පරිහරණ අයිතිය පවතින අතර එම ඉඩම් වල පරම අයිතිය මහවැලි අධිකාරිය සතු නොවේ. එමෙන්ම සංවර්ධන කාර්යයන් සඳහා යොදාගනු ලබන ඉඩම්, මහවැලි ජනපදිකයින් හා ව්‍යවසායකයින් වෙත බැහැර කරනු ලබයි. මෙහිදී ගොවි පංතියේ පුද්ගලයින් වෙත ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ ගොඩ, වාරි, කෘෂිකාර්මික හා වර්ෂාපෝෂිත ඉඩම් නොමිලේ ලබා දෙන අතර ව්‍යවසායකයින් හා වැඩි ආදායම් කාණ්ඩයේ පුද්ගලයින් වෙත රජයේ ඉඩම් ආඥා පනත යටතේ වාණිජ හා ආයෝජන ඉඩම් ලෙස රජයේ තක්සේරුව මත බදු මුදල් අය කර හා නිවාස ඉඩම් ලෙස රජයේ තක්සේරුව අයකර බැහැර කිරීම් සිදු කරයි. | තක්සේරු කිරීමට පියවර ගත යුතුය |
| | **(ii)**2.2 ඡේදය | පෞරාණික උරුමයක් ලෙස හඳුනාගත් ගොඩනැගිලි හැර අනෙකුත් සියළුම ගොඩනැගිලි තක්සේරු කොට කොම්ප්ට්‍රොලර් ජනරාල් වෙත ගොඩනැගිලි පිළිබඳ තොරතුරු ඉදිරිපත් කළ යුතු වුවත් 2020 දෙසැම්බර් 31 දින වන විටත් එම තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. | ඉකුත් වර්ෂය සඳහා අදාළ තොරතුරු යාවත්කාලීන කර මේ වන විට කොම්ප්ට්‍රොලර් ජනරාල් ඉදිරිපත් කර ඇත. සමාලෝචිත වර්ෂය සඳහා තොරතුරු යාවත්කාලීන කිරීමට පවතින වසංගත තත්වය හමුවේ කාර්යාල වසා තිබීම හේතුවෙන් ප්‍රමාද වී ඇති අතර කඩිනමින් එම තොරතුරු යාවත්කාලීන කර කොම්ප්ට්‍රොලර් ජනරාල් වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | චක්‍රලේඛ නියමයන්ට අනුව ගොඩනැගිලි තක්සේරු කොට ඒ සම්බන්ධ විස්තර ඉදිරිපත් කිරීමට පියවර ගත යුතුය. |
| (ඇ) | 2009 දෙසැම්බර් 24 දිනැති අංක 2009/12/04/පාලන දරන අධිකාරියේ අභ්‍යන්තර චක්‍රලේඛයේ 3.1 වගන්තිය | වෙනත් ආයතනවල රජයේ සේවකයින්ගෙන් නිල නිවාස කුලී වශයෙන් මාසික වැටුපෙන් සියයට 12.5 ක් මාසික කුලිය ලෙස අයකල යුතු වුවත් ඊට පටහැනිව විගණිත දිනය වූ 2021 පෙබරවාරි 8 වන විට දිගන ප්‍රධාන වේලි හා ජලාශ මෙහෙයුම් අංශය සතු නිල | වෙනත් ආයතනවල රජයේ සේවකයින් වෙත ලබා දී ඇති නිලනිවාස සඳහා නිවාස කුලී වශයෙන් චක්‍රලේඛ ප්‍රකාරව මාසික වැටුපෙන් සියයට 12.5 ක මුදලක් අය කිරීමට කටයුතු කර ඇත. එසේ නොකරන නිල නිවාස ලබාගෙන ඇති නිලධාරින්ගෙන් සන්තකය ආපසු පවරා ගැනීමට 2018 වර්ෂයේ දී | චක්‍රලේඛ නියමයන්ට අනුව නිල නිවාස සඳහා ගාස්තු අයකිරීමට පියවර ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | නිවාස 39 ක් සඳහා විවිධ මාසික ගාස්තු අයකර තිබුණි. | නීතිමය පියවර ගෙන ඇත. | |
| (ඉ) | 2017 මැයි 09 දිනැති අංක ඩීජී/05/2017 දරන අධිකාරියේ අභ්‍යන්තර චක්‍රලේඛයේ | | | |
| | (i) ඒ 1-1 වගන්තිය | කලාපයේ/අංශයේ නිවාස කමිටුව මඟින් නිලධාරීන්ගේ නිල නිවාස අවශ්‍යතා හඳුනාගෙන අධ්‍යක්ෂ ජනරාල්ගේ පූර්ව අනුමැතිය මත පමණක් බාහිර රජයේ නිළධාරීන් වෙත නිල නිවාස ලබා දිය යුතු වුවත් ඊට පටහැනිව ප්‍රධාන වේලි හා ජලාශ මෙහෙයුම් අංශය විසින් නිල නිවාස 5 ක් බාහිර පාර්ශව වෙත ලබා දී තිබුණි. | දිගන නිල නිවාස කඳවුරේ අධිකාරියේ සේවකයන්ට නේවාසික පහසුකම් ලබාදීමෙන් අනතුරුව අතිරික්තව පවතින නිල නිවාස ඇත්නම් බාහිර රාජ්‍ය ආයතන නිලධාරින් සඳහා ඉල්ලුමට අනුව තාවකාලිකව ලබාදෙන ලෙස චක්‍රලේඛනයේ අංක A 1-2 වගන්තිය මගින් සලසා ඇති ප්‍රතිපාදන අනුව කටයුතු කර ඇත. මේ දක්වාම ආරම්භයේ සිට බාහිර ආයතනවලට නිවාස ලබාදීමේදි නිවාස කමිටුව හරහා තීරණ ගෙන කටයුතු කර ඇත. නමුත්, චක්‍රලේඛයට අනුව මෙම නිවාස අදාල රාජ්‍ය ආයතනයේ ප්‍රධානින්ගේ නිර්දේශයට අනුව තාවකාලික පදනම මත විධිමත්ව වාර්ෂික ගිවිසුම් වලට අනුව ලබාදී ඇත. කෙසේ වෙතත් 2021 වර්ෂයේ සිට අභ්‍යන්තර චක්‍රලේඛයේ A1-1 වගන්තිය ප්‍රකාරව ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමි. | චක්‍රලේඛ නියමයන්ට අනුව බාහිර රජයේ නිළධාරීන් වෙත නිල නිවාස ලබාදීම සිදු කල යුතුය. |
| | (ii) ඒ 1-1 7 වගන්තිය | විධිමත් ලිඛිත භාරදීමේ ලේඛනයක් හා එකඟතා ගිවිසුමකට යටත්ව පමණක් නිල නිවාස බාහිර රජයේ නිලධාරීන් වෙත ලබා දියයුතු වුවත් ඊට පටහැනිව දිගන ප්‍රධාන වේලි හා ජලාශ මෙහෙයුම් අංශයට අයිති නිල නිවාස 24 ක් ගිවිසුම් ගත වීමකින් තොරව ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයන් වෙත ලබා දී තිබුණි. මෙම නිල නිවාස 1985/1986 වර්ෂවල ලබා දී තිබුණු අතර ඒවායේ | ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයින්ගේ පදිංචිය සඳහා 1985 වර්ෂයේ සිට අධිකාරියට අයත් දිගන නිලගම නිවාස කඳවුරේ නිවාස 24 ක් ලබාදී ඇත. මේ සඳහා නිශ්චිත කුලී මුදලක් පදිංචිකරුවන්ගෙන් අයකර මේ දක්වාම අධිකාරිය වෙත එවා ඇත. අධිකාරියේ අභ්‍යන්තර චක්‍රලේඛයට අනුව නිවාසවල පදිංචිකරුවන් හඳුනාගෙන ඔවුන්ට අප ආයතනය සමඟ ගිවිසුම් ගත වන ලෙස ලිඛිතව කිහිපවිටක්ම දැනුම් දුන් නමුත්, එම උපදෙස් වලට කිසිදු | චක්‍රලේඛ නියමයන්ට අනුව විධිමත් ලිඛිත භාරදීමේ ලේඛනයක් හා එකඟතා ගිවිසුමකට යටත්ව පමණක් නිල නිවාස බාහිර රජයේ නිලධාරීන් වෙත ලබා දිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වර්තමාන පදිංචිකරුවන් හඳුනාගෙන ඔවුන් නිල නිවාස සඳහා හිමිකම් ඇති සේවකයන් නම් ඔවුන් සමඟ ගිවිසුම් ගත වීමට හෝ අනවසර පදිංචිකරුවන් නම් අනවසර පදිංචිය ඉවත්කිරීමට අවශ්‍ය නෛතික ක්‍රියාමාර්ග අනුගමනය කර නොතිබුණි. | ප්‍රතිචාරයක් දක්වා නොමැත. නමුත් නිවාසවල පදිංචිකරුවන් 2002 වර්ෂයේදී පමණ තීරණය කරන ලද නිශ්චිත මුදලක් නිවාස කුලිය ලෙස මාසිකව අයකර එම මුදල් අධිකාරියට එවා ඇත. ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයින් ගිවිසුම් අත්සන් නොකිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ, ප්‍රධාන වේලි හා ජලාශ මෙහෙයුම් විසින් කිහිපවරක්ම ලිපි යැවූ නමුත් ඊට ප්‍රතිචාර නොදැක්වීම හේතුවෙන් මාගේ අත්සනින් ලංකා විදුලිබල මණ්ඩලයේ සභාපති වෙත ලිඛිත දැනුම් දීම් කරන ලදි . මේ දක්වා එම ලිපිවලට ද සතුටුදායක පිළිතුරක් නොලැබුණු අතර, ලංකා විදුලිබල මණ්ඩලයේ මධ්‍යම පළාත් ප්‍රාදේශිය කළමනාකරු විසින් එම සේවකයින් විදුලිබල මණ්ඩලය සමඟ අභ්‍යන්තර ගිවිසුමකට එළඹී ඇති බව දන්වා ඇත. තවද, විදුලිබල මණ්ඩලයට මෙම නිල නිවාස පවරා ගෙන ඇති බවත් ඔවුන් විසින් නඩත්තු කටයුතු ඉටුකරගන්නා බවත් අප සමඟ ගිවිසුම්ගත වීමට අවශ්‍ය නොවන බව වැඩිදුරටත් දන්වා ඇත. කෙසේ නමුත් මේ සම්බන්ධව දැනුවත් කර ඉදිරි ක්‍රියාමාර්ග සඳහා ලේකම්, විදුලිබල අමාත්‍යාංශය වෙත ලිඛිතව දැනුම් දී ඇත. | |
| (iii) ඒ - 3 හා සී - 1 වගන්ති | අධිකාරියේ නිවාස හා ගොඩනැගිලි කාණ්ඩගත කර වෙන වෙනම වත්කම් ලේඛණ පවත්වා ගත යුතු වුවත් ප්‍රධාන වේලි හා ජලාශ මෙහෙයුම් අංශය විසින් නිල නිවාස හා ගොඩනැගිලි කාණ්ඩගත කර ස්ථාවර වත්කම් ලේඛණ නඩත්තු කර නොතිබුණි. තවද පවත්වාගෙන යාම ආර්ථික වශයෙන් ඵලදායී නොවන | දිගන නිල නිවාස කඳවුරේ නිල නිවාස පරිපාලන භාරකාරත්වය අධිකාරියේ අංශ තුනක් මගින් ක්‍රියාත්මක වේ. එනම් නේවාසික ව්‍යාපාර කළමනාකාර (ඊ කලාපය), මහවැලි ආරක්ෂක බලකාය සහ ප්‍රධාන වේලි හා ජලාශ මෙහෙයුම් අංශය වශයෙනි. මේ අයුරින් දිගන ප්‍රධාන වේලි හා ජලාශ මෙහෙයුම් අංශය මගින් පාලනය හා නඩත්තු වන නිවාස ගණන 85 කි. ඉදිරියේ දී මෙම නිවාස හා ගොඩනැගිලි | චක්‍රලේඛ නියමයන්ට අනුව නිල නිවාස ගොඩනැගිලි නඩත්තු කිරීමට පියවර ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | නිවාස හෝ ගොඩනැගිලි නිසි පරිදි හඳුනාගෙන ඒ සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ යෝජනා අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතු වුවත් එපරිදි කටයුතු කර නොතිබුණි. නිසි පරිදි නඩත්තු නොකිරීම නිසා වල් වැදී අත්හැර දමන ලද නිල නිවාස 3 ක් විය. | නිසි පරිදි නඩත්තු කිරීමට පවතින ප්‍රතිපාදන සීමාවන් මත අවශ්‍ය පියවර ගනු ලබන බව දන්වා සිටිමි. අභ්‍යන්තර චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කිරීමට අදාල නිලධාරීන් දැනුවත් කල අතර, ඒ අනුව 2021 වර්ෂයේ වත්කම් ලේඛණය යාවත්කාලීන කිරීමට කටයුතු කරන ලදී. | |
| (ඊ) | 2017 මාර්තු 8 දිනැති අංක DG/04/2017 දරන අධිකාරියේ අභ්‍යන්තර චක්‍රලේඛය | ගොවි සංවිධානයක් වෙත කොන්ත්‍රාත්තුවක් ලබාදීමේදී ඒකක කළමානාකාර, ආයතන සංවර්ධන නිළධාරී, ඉංජිනේරු සහකාර, කොට්ඨාශ කළමානාකාර, නියෝජ්‍ය නේවාසික ව්‍යාපාර කළමනාකාර (සංවර්ධන), නියෝජ්‍ය නේවාසික ව්‍යාපාර කළමනාකාර (තාක්ෂණ සේවා) යන නිළධාරීන් විසින් කොන්ත්‍රාත්තුව ලබාදීම පිළිබඳ සිය නිර්දේශ ලිඛිතව නේවාසික ව්‍යාපාර කළමනාකාර/ ව්‍යාපෘති අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කිරීමෙන් පසු කොන්ත්‍රාත් පිරිනැමීම සිදු කළ යුතුය. එසේ වුවද බෝවතැන්න කාර්යභාර ඉංජිනේරු කාර්යාලය විසින් කණ්ඩලම වැව් බැම්ම නඩත්තු කටයුතුවලට ශ්‍රමිකයින් ලබාගැනීම වෙනුවෙන් රු.1,430,000 ක වටිනාකමකට කණ්ඩලම වම් ඇල මහවැලි ගොවි සංවිධානය වෙත සෘජු කොන්ත්‍රාත් ලබාදීමේදී උක්ත චක්‍රලේඛය ප්‍රකාරව ඉහත නිළධාරීන්ගේ නිර්දේශ නොමැතිව කොට්ඨාස කළමනාකරුගේ නිර්දේශය මත පමණක් | කාර්යභාර ඉංජිනේරු කාර්යාලයකින් සමෘද්ධි සංගම්, ගොවිජන සේවා ගොවි සංවිධාන හා මහවැලි අධිකාරියේ ගොවි සංවිධාන සහ අනෙකුත් ලියාපදිංචි සංවිධාන වෙත කොන්ත්‍රාත් පිරිනමනු ලැබේ. මහවැලි ගොවි සංවිධාන වෙත කොන්ත්‍රාත් පිරිනැමීමේදී අදාළ ලියකියවිලි ගොවි සංවිධානය අයත් කොට්ඨාස කළමනාකාර වෙත යොමු කරනු ලබන අතර, එහිදී කොට්ඨාස කළමනාකාර විසින් අදාළ චක්‍රලේඛ අනුව පරීක්ෂා කොට බලා නිර්දේශ ඉදිරිපත් කරනු ලබයි. | චක්‍රලේඛ නියමයන්ට අනුව ගොවි සංවිධානය වෙත සෘජු කොන්ත්‍රාත් ලබාදීමේදී අදාල නිලධාරීන් ගේ නිර්දේශ ලබාගැනීමට පියවර ගත යුතුය. |

කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි.

**1.8 බදු රෙගුලාසිවලට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2002 අංක 14 දරන එකතු කල අගය මත බදු (සංශෝධිත) පනතේ 10 (ආ) වගන්තිය | මාස 12 කාලසීමාවකදී භාණ්ඩ හා සේවා සැපයුම්වල මුළු වටිනාකම රු. මිලියන 12 ඉක්මවන්නේ නම් පනත යටතේ එකතුකල අගය මත බදු සඳහා ලියාපදිංචි වියයුතු නමුත් අධිකාරිය විසින් අදාල ආදායම් ඉකුත් වර්ෂයේදී රු. මිලියන 1,920 ක් හා සමාලෝචිත වර්ෂයේ රු. මිලියන 755 ක ආදායමක් රැස්කර තිබුණද එකතු කල අගය මත බදු සඳහා ලියාපදිංචි වීමට කටයුතු කර නොතිබුණි. | අධිකාරියේ ප්‍රධාන ආදායම් ප්‍රභවයන්වන ඉඩම්, වැලි, පස්, ජලය වැනි ස්වාභාවික සම්පත් මඟින් ලැබෙන ඉඩම් බදු හා පුරස්කාරයන් (ඉඩම් පරිහරණ ගාස්තු) ස්වාභාවික සම්පත් මඟින් ලැබෙන ආදායම් වන අතර මෙම ස්වාභාවික සම්පත් ඒ ආකාරයෙන්ම එනම් වටිනාකම වැඩි කිරිමට නැවත නිෂ්පාදනයක් නොකර (No Manufacturing) සේවාවන් සැපයීම වෙනුවෙන් ලැබෙන ආදායමක් වන බැවින් එම ආදායම අගය එකතු කිරිමේ බද්දට යටත් නොවන බව දන්වමි. නමුත් ස්වාභාවික සම්පතක් වන ජලය වෙනත් ආයතනයකට/ පුද්ගලයෙකුට විකුණන විට එම ස්වාභාවික සම්පතට යම් අගයක් එකතු වේ. එලෙස ජලය බදු දිම (විකිණීම) මත උපයන පුරස්කාර ආදායම, අගය එකතු කිරීමේ බද්දට යටත් වුවද අධිකාරියේ වාර්ෂික පුරස්කාර ආදායම රුපියල් මිලියන 300 නොඉක්මවන බැවින් 2020 ජනවාරි 06 වන දින රජය මඟින් නිකුත් කර ඇති ගැසට් නිවේදනය ප්‍රකාරව අගය එකතු කිරිමේ බද්දට යටත් නොවන බව දන්වමි. | එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි කිරීමට කටයුතු කළ යුතුය. |

## 02. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.588,403,000 ක අලාභයක් වූ අතර, ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අලාභය රු.267,788,000 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.320,615,000 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට රාජ්‍ය භාග ආදායම් අඩුවීම සහ රජයේ ප්‍රාග්ධන ප්‍රතිපාදන ලැබීම අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**03. මෙහෙයුම් සමාලෝචනය**
--------------------------

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**
----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතියෙන් 2017 වර්ෂයේදී අධිකාරිය වෙත ලැබී දෙහිඅත්තකණ්ඩිය නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලයට අනුයුක්ත කර තිබුණු වාහනයක් මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යවරයාගේ උපදේශකගේ කටයුතු වෙනුවෙන් මැදිරිගිරිය කලාපයේ රියදුරකු වෙත ලබා දී තිබුණි. 2019 දෙසැම්බර් 22 දින එම වාහනය අනතුරකට ලක් වී තිබුණි. මුදල් රෙගුලාසි 104(4) අනුව අලාභහානිය සිදු වූ දිනයේ සිට මාස 03 ක් ඇතුළතදී හානි සම්බන්ධ පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුවත් උක්ත අනතුර සිදු වී මාස 11 කට අධික කාලයක් ගත වී තිබුණද අනතුර සම්බන්ධයෙන් පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. වාහනයට සිදු වූ රු. 6,915,484 ක අලාභය අදාල වගකිව යුතු නිළධාරීන්ගෙන් අයකර ගෙන නොතිබුණි. මෙම නිළධාරියා විසින් 2010, 2011 කාලසීමාව තුල වාහන දෙකක් අවභාවිතය කිරීම නිසා අධිකාරියට සිදුව තිබුණු රු. 575,929 ක මුල්‍යමය අලාභය 2020 දෙසැම්බර් 31 දින වන විටත් පියවා නොතිබුණි. | මේ අනතුර සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන අංශය මඟින් විමර්ශණයක් සිදු කර ඇත. එසේම මෙම අනතුරින් පසු මා විසින් පත්කරන ලද අභ්‍යන්තර කමිටුවක් මඟින් වාහනය පරීක්ෂා කර බලා පරිපූර්ණ වාර්තාවක් ඉදිරිපත් කර ඇත. මෙම වාහනය වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතිය මඟින් අධිකාරිය වෙත ලැබී ඇත. තක්සේරු දෙපාර්තමේන්තුවට තක්සේරු කිරිම සඳහා යවන ලද වාහන ලේඛණයේ සඳහන් වාහන තුල මෙම වාහනයද අන්තර්ගතය. තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තක්සේරුව මේ වන විට ලැබී නොමැති බැවින් එය ලැබීමෙන් පසු ස්ථාවර වත්කමක් ලෙස ගිණුම්ගත කිරිමට කටයුතු කරනු ලැබේ. එසේම මගේ අංක MA/ADM/10/02/1708 හා 2021 ජූනි 25 දිනැති ලිපිය මඟින් 2021 ජූලි මස සිට වාරික 10 කින් ආයතනයට සිදුවූ මූල්‍යමය අලාභය අයකිරිමට හුරුළුවැව කලාපයට දැනුම් දී ඇත. | පාඩු හා හානි සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර අදාල වගකිව යුතු පාර්ශව වෙතින් එය අයකර ගැනීමට පියවර ගත යුතුය. |
| (ආ) | අධිකාරියට අයත් ගබඩා 43 ක් 2009 වර්ෂයේ සිට වී අලෙවි මණ්ඩලය විසින් භාවිතා කරනු ලැබුවද, එම ගබඩා වෙනුවෙන් කිසිදු කුලී මුදලක් 2020 දෙසැම්බර් 31 දින වනවිටත් අයකර ගෙන නොතිබුණි. එම ගබඩා වී ගබඩා කිරීමට ප්‍රමිතගත පරිදි අලුත්වැඩියා කිරීමේ අවශ්‍යතාවයක් පවතින බැවින්, එම ගබඩාවල අයිතිය වී අලෙවි | මෙම පැවරීම් කටයුතු සිදුකිරීම සඳහා අධිකාරියට අයත් වී අලෙවි මණ්ඩලය විසින් ඉල්ලුම් කර ඇති ගබඩා ගොඩනැගිලිවල තක්සේරු වාර්තා ලබා ගැනීමට තක්සේරු දෙපාර්තමේන්තුව වෙත අදාළ තොරතුරු යොමු කර ඇත. තක්සේරු වාර්තා ලද පසු ඉදිරි කටයුතු සිදු කරන බව දන්වමි. | ගබඩා කාර්යක්ෂමව හා ඵලදායීව භාවිතාකිරීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතු අතර අදාල කුලී මුදල් අයකර ගත යුතුය. |

මණ්ඩලය වෙත පවරා දෙන මෙන් වී අලෙවි මණ්ඩලයේ සභාපති විසින් මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්ගෙන් ඉල්ලීමක් කර තිබුණි. කෙසේ වුවද එම ඉඩම් පැවරීමට හෝ බදු මුදල් අයකර ගැනීමට 2020 දෙසැම්බර් 31 දින වනවිටත් අපොහොසත්වී තිබුණි.

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) දිගන ප්‍රධාන වේලි හා ජලාශ මෙහෙයුම් අංශයට අයත් මධ්‍යම ඉංජිනේරු කාර්යයන් පිළිබඳ උපදේශක කාර්යාංශයේ සේවකයන් හට ලබා දී තිබුණු නිල නිවාස 5 ක සන්තකය අධිකාරිය වෙත ආපසු ලබාගැනීම සඳහා නඩු පවරා තිබුණද නිසි පරිදි නිවාස කුලී ගෙවීමට එකඟවූ බව දක්වමින් පසුව අධිකාරිය විසින් එම නඩු ඉල්ලා අස්කරගෙන තිබුණි. එසේ වුවද ඉන් එක් නිවසක ගිවිසගත් පරිදි නිවාස කුලී අයකරගෙන නොතිබුණි. තවත් නිල නිවසක් 2018 සැප්තැම්බර් 25 දින ගින්නකින් විනාශ වී තිබුණු අතර පදිංචිව සිටි අනවසර පදිංචිකරු පදිංචිය අතහැර ගොස් තිබීම හේතුවෙන් කුලී ගෙවීමට එකඟතාවයක් ඇතිකරගෙන නොතිබුණි. එසේම තවත් නිල නිවාස 6 ක සන්තකය ආපසු ලබාගැනීම සඳහා 2020 වර්ෂයේදී නඩු ගොනුකර 2020 පෙබරවාරි 19 දින නෙරපීම් නියෝග ලබාගෙන තිබුණද විගණිත දිනය වූ 2020 දෙසැම්බර් දක්වා නිල නිවස 5ක සන්තකය අධිකාරිය වෙත ලබා ගෙන නොතිබුණි. එලෙස නෙරපීම් නියෝගය ලද එක් නිල නිවාසක් 2020 ඔක්තෝබර් 21 දින ගිනිගැනීමකට ලක්ව තිබුණි. ගිනි හානියේ දළ ඇස්තමේන්තුව රු. 1,225,875 ක් වූ අතර, අයවියයුතු හිඟ කුලිය රු 205,320 ක් විය. විගණිත | **JSQ** 07 නිල නිවාස කණිෂ්ඨ කාර්යය මණ්ඩලයේ සේවකයින් සඳහා තනිකඩ නිවාස (තනි කාමරයක් සහිත) බැවින් සියයට 12.5 ක් අය කිරීම සිදු නොකෙරේ. මේ අනුව සාධාරණ කුලියක් රජයේ තක්සේරු මුදලට අනුරූපී වන සේ කුලියක් මාසිකව අය කෙරේ. මෙහි සඳහන් නිවාස සන්තකය ආපසු පවරා ගැනීමට නඩු ගොනු කොට 2020 පෙබරවාරි 19 වන දින නෙරපීම් නියෝග ලැබී තිබුණි. නමුත් රටතුල ඇතිවුණ කොවිඩ් -19 වසංගත රෝග තත්වය හේතුකොට ගෙන ඉදිරි අධිකරණ ක්‍රියාමාර්ග (ඇක්කිසි ක්‍රියාත්මක කිරීම) කල්දමා තිබුණි. මේ අතරතුර අපගේ නිලධාරි විසින් නෙරපීම් නියෝග ක්‍රියාත්මක කර ගැනීම සඳහා කිහිපවරක් උසාවියේ රෙජිස්ටාර් හමුවී දින නියම කර ගැනීමට උත්සාහ දරා ඇත. ඉදිරි ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම කල්තැබූ බව රෙජිස්ටාර්වරයා විසින් දැනුම් දී ඇත. කෙසේ වෙතත් 73-**A** සහ 221-**A** යන නිවාස වල පදිංචිකරුවන් නියෝග ක්‍රියාත්මක කිරීමට පෙර ඉවත්වී ඇත. ඒ අනුව විගණන දිනය වන විට නිවාස 03 ක සන්තකය ලැබී තිබුණු අතර, ඒවායේ නඩත්තු කටයුතු අධිකාරිය විසින් ආරම්භ කර තිබුණි. 188 –**B** නිල නිවාසය ගිනි ගෙන විනාශ වීමත් සමඟ අනවසරකරු පදිංචිය හැරදමා | නිල නිවාස සඳහා හිමිකම් නොමැති පදිංචිකරුවන් නිවාස වලින් ඉවත්කිරීමට අවශ්‍ය නෛතික ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතු අතර හිඟ කුලී හා නිල නිවාසවලට සිදුව ඇති පාඩු හා හානි වගකිව යුතු පාර්ශව වෙතින් අයකර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | දිනට මෙම අලාභය අයකර ගැනීම සඳහා ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ගොස් ඇත. ගිනි ගැනීමට ලක්වූ එම නිල නිවාසය පිළිබඳ ඉදිරි නීතිමය කටයුතු සිදු කෙරෙමින් පවති. ඉතිරි නිවාස 02 ක් සඳහා දෙසැම්බර් මස 28 වන දින නෙරපීම් නියෝග ක්‍රියාත්මක කෙරුණි. ඒ අනුව මේ වන විට නිවාස 04 ක් මහවැලි අධිකාරියේ සන්තකයට පවරා ගෙන ඇති අතර, අනෙකුත් නිවාස 02 සඳහා අප්‍රේල් මාසයේ ක්‍රියාත්මක කිරීමට උසාවිය මඟින් දින වෙන් කර දී ඇත. | |
| (ආ) | දිගන ප්‍රධාන වේලි හා ජලාශ මෙහෙයුම් අංශයේ සහ බෝවතැන්න කාර්යභාර ඉංජිනේරු කාර්යාලයේ නඩත්තු හා සේවා කටයුතු සඳහා ශ්‍රමිකයින් ලබාගැනීමේදී එම කොන්ත්‍රාත් ගිවිසුමේ 4.9 වගන්තිය අනුව කොන්ත්‍රාත්කරුගේ පොත්පත්, චෙක්රෝල්, පොරොත්තු ලේඛණ හෝ මෙම ගිවිසුමට අදාල කාර්යයන් ඉටුකිරීමට සේවයේ යොදවා ඇති ශ්‍රමිකයින් පිළිබඳව වූ වෙනත් ලියකියවිලි පරීක්ෂා කිරීමට හැකි පරිදි එම ලේඛණ පවත්වාගත යුතු වුවත් එම ලියකියවිලි ගොවි සංවිධාන නියෝජිතයා හෝ අධිකාරිය විසින් විධිමත්ව පවත්වා නොගැනීම නිසා එම ගෙවීම්වල නිවැරදිභාවය තහවුරු කර ගත නොහැකි විය. තවද ප්‍රධාන වේලි හා ජලාශ මෙහෙයුම් අංශයේ නඩත්තු හා සේවා කටයුතු සඳහා අවශ්‍ය ශ්‍රමිකයින් ලබාගැනීම දිගුකාලයක් අඛණ්ඩව එකම ගොවි සංවිධානයකින් සිදුකර තිබුණි. එම ශ්‍රමිකයින්ගේ දෛනික පැමිණීම හා පිටවීම සහ සිදු කල වැඩ ප්‍රමාණය සේවය ලබාගන්නා අධීක්ෂණ නිලධාරියෙකු විසින් සහතික කර නොතිබුණි. | නඩත්තු කාර්යන් සඳහා අවශ්‍ය ශ්‍රමිකයන් ප්‍රජා මූල සංවිධානයකින් කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවා ගැනේ. මෙම ශ්‍රම කොන්ත්‍රාත්තුවට අනුව නඩත්තු අංශයේ දෛනික කාර්යයන් සඳහා ශ්‍රමිකයන් එම සංවිධානය මඟින් නඩත්තු අංශයේ ඉල්ලුම පරිදි ලබාදීම සිදුකරයි. ඒ අනුව එක් එක් කාර්යභාර ඉංජිනේරු කාර්යාලයන් සඳහා දෛනිකව සැලසුම් කරන ලද නඩත්තු කාර්යන් සඳහා අවශ්‍ය පුහුණු, අර්ධ පුහුණු හා නුපුහුණු කම්කරුවන් පිළිබඳ තොරතුරු ප්‍රධානවේලි හා ජලාශ මෙහෙයුම් අංශයේ නඩත්තු අංශය වෙත යොමු කෙරේ. නඩත්තු කාර්යන් සඳහා ඒ ඒ කාර්යභාර ඉංජිනේරු කාර්යාලයන් සඳහා කම්කරුවන් යෙදවීම එම අංශයේ කාර්මික සහකාර විසින් කරනු ලබන අතර ඉටු කරනු ලබන අළුත්වැඩියා කටයුතු එම අංශයේ ඉංජිනේරු සහකාරවරුන් දෙදෙනකු විසින් අධීක්ෂණය කරනු ලැබේ. යෝජිත අළුත්වැඩියාවන් අවසන් වූ පසු අදාල පාර්ශවයන් විසින් අළුත්වැඩියාවන් සෑහීමකට පත්වන අයුරින් ඉටු කල බවට ලිඛිත සහතිකයක් ඉදිරිපත් කරනු ලැබේ. මේ ආකාරයට දෛනිකව සිදුකරනු ලබන අළුත්වැඩියාවන් සියල්ල මාසික ප්‍රගති වාර්තාවට ඇතුලත් කර ප්‍රධාන වේලි හා ජලාශ මෙහෙයුම් අංශයේ නඩත්තු අංශ ප්‍රධානියා වන නියොජ්‍ය අධ්‍යක්‍ෂ (සිවිල්) වෙත | කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව ගොවි සංවිධාන විසින් නඩත්තු කල යුතු ලේඛණ පවත්වාගන්නේද යන්න මහවැලි අධිකාරිය විසින් පසුවිපරම් කළ යුතු අතර මහවැලි අධිකාරියේ සුපරීක්ෂණය යටතේ ශ්‍රමිකයින්ගේ දෛනික පැමිණීමේ හා පිටවීමේ ලේඛණයක් ( ගොවි සංවිධානයේ ලිපි ශීර්ෂ සහිත ) නඩත්තු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ඉදිරිපත් කරනු ලැබේ. මෙම කොන්ත්‍රාත්තු සඳහා මාසිකව කොටස් වශයෙන් ගෙවීම් කරන අතර ගෙවීම් කටයුතු වලදී නියෝජ්‍ය අධ්‍යක්‍ෂ (සිවිල්) විසින් අදාල මාසික ප්‍රගති වාර්තාව පරීක්‍ෂා කර බලා ගෙවීම් අනුමත කරනු ලැබේ. විමසුමේ සඳහන් පරිදි සමිතියෙන් එවනු ලබන ශ්‍රමිකයන්ගේ විස්තර ලේඛණය අදාල කොන්ත්‍රාත් සමිතිය විසින් නඩත්තු කරනු ලබන අතර අප කාර්යාලය මගින් ශ්‍රම ඒකක ගණන පමණක් පොත්පත් වල සටහන් කරනු ලැබේ. ඊට හේතුව මීට පෙර අවස්ථා කිහිපයකදී කම්කරු අයිතින් සම්බන්ධ (EPF ගෙවීම්) ගැටළුවක් මතුවීම නිසා කම්කරු අයිතින් පිලිබඳ වගකීම අදාල සමිතිය විසින් දැරිය යුතු බවට කොන්ත්‍රාත් ගිවිසුම සංශෝධනය කිරීම නිසාවෙනි. | |
| (ඇ) | 2020 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ ඉඩම් ආයෝජන ව්‍යාපෘති සඳහා දිගුකාලීන බදු පදනමට ලබාදීම පිළිබඳ විගණනයේදී කලාප 10 කින් තොරතුරු ඉල්ලා තිබුණද කලාප 5 පමණක් නියමිත ආකෘතිය ප්‍රකාරව තොරතුරු ඉදිරිපත් කර තිබුණි. මේ හේතුවෙන් අධිකාරිය විසින් ආයෝජන ව්‍යාපෘති සඳහා බැහැර කළ ඉඩම්වල සංවර්ධනය පිළිබඳ සමස්ත තත්ත්වය විගණනය කිරීමට නොහැකි විය. තොරතුරු ඉදිරිපත් කරන ලද කලාප 05 හි ආයෝජන ව්‍යාපෘති සඳහා ලබාදුන් ඉඩම් ප්‍රමාණය අක්කර 5,755 ක් වූ අතර ඉන් කිසිදු සංවර්ධනයක් නොකළ ඉඩම් ප්‍රමාණය අක්කර 2,121 ක්ද සංවර්ධනය කරමින් ඇති ඉඩම් ප්‍රමාණය අක්කර 496 ක්ද සම්පූර්ණයෙන්ම සංවර්ධිත ඉඩම් ප්‍රමාණය අක්කර 3,138 ක්ද වශයෙන් පැවතුණි. ඒ අනුව ලබාදුන් මුළු ඉඩම් ප්‍රමාණයෙන් සියයට 37 ක් කිසිදු සංවර්ධනයක් කර නොතිබුණි. විගණනය වෙත තොරතුරු ලබාදුන් කලාප 7 ක ඉඩම් ලබාදුන් ආයෝජකයින් 123 දෙනෙකුගෙන් 2020 දෙසැම්බර් 31 දිනට | මහවැලි එල් කලාපය, රඹකැන්ඔය, මොරගහකන්ද යන කලාප වල ආයොජන ව්‍යාපෘති ඉඩම් 60 ක් පමණ බැහැර කර ඇති අතර එහි වපසරිය අක්කර 2600 ක් පමණ වේ. රඹකැන්ඔය කලාපය ආයෝජකයින් 4 දෙනෙකු සඳහා අක්කර 1250 ක් පමණ කන්න වගාවට ලබා දි ඇති අතර ඔවුන් ඉඩම් වගාව සඳහා සූදානම් කිරිමේදී එයට එරෙහිව පැවති මහජනතා විරෝධතා හේතුවෙන් සංවර්ධන සඳහා බාධා ඇති විය. ඒ අනුව අදාළ ඉඩම් අක්කර 1250 ආයෝජකයන් 04 දෙනා වෙත ලබා දීම සම්බන්ධව අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියට ඉදිරිපත් කරන ලද අතර පරිසර නිර්දේශය හා කාර්ය සාධනය මත හා ව්‍යාපෘති ඉඩම් බැහැර කිරිමට කටයුතු කරන ලෙස දන්වා ඇත. ඒ අනුව සැප්තැම්බර් මාසය වන විට සියළුම බදු නොගෙවන ආයෝජන ව්‍යාපෘති ඉඩම් අවලංගු කිරිමට කටයුතු කරනු ලැබේ. එල් කලාපයේ ඉඩම් සංවර්ධනය කිරිම සඳහා පරිසර අධිකාරියේ, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ හා වනජීවි | ඉඩම් ලබාදිමේ පරමාර්ථ ඉටුකරගත හැකි පරිදි ඉඩම් සංවර්ධනය කිරීම පිළිබඳ පසුවිපරම් කල යුතු අතර සංවර්ධනය නොකරන ඉඩම් නැවත පවරාගෙන සුදුසු කාර්යයන් සඳහා භාවිතා කළ යුතුය. හිඟ බදු අයකරගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | රු.68,598,808 ක බදු මුදලක් අය විය යුතුව පැවතුණි. | දෙපාර්තමේන්තුවේ අනුමැතිය නොලැබීම මත සංවර්ධනය කිරිමට නොහැකි වී ඇත. ඒ සඳහා පන්සල් කන්ද ප්‍රදේශයෙන් බැහැර කර ඇති ආයෝජකයින් 05 දෙනෙකුගේ ඉඩම් ආපසු රජයට පවරා ගෙන වන සතුන් හුවමාරු වන ස්ථානයක් ලෙස පවත්වාගෙන යාම අවශ්‍ය වේ. ඒ අනුව මේ වන විට පවරා ගනු ලබන ඉඩම් කොටස් 05 සඳහා විකල්ප ඉඩම් ලබා දීම සම්බන්ධයෙන් සාකාච්ඡා වෙමින් පවති. මොරගහකන්ද කලාපයේ ආයෝජකයින් 08 දෙනෙකු සඳහා අක්කර 80 පමණ බැහැර කර ඇති අතර ඒ අතරින් ඉඩම් කොටස් 04 ක ව්‍යාපාර කටයුතු සිදුකරමින් ගෙවාගෙන යනු ලබයි. සංචාරක ව්‍යාපෘති සඳහා ඉඩම් කොටස් 03 ක් බැහැර කර ඇති අතර එම ව්‍යාපෘති සංවර්ධනය කිරිම සඳහා යටිතල පහසුකම් සම්පූර්ණ කර නොමැති බැවින් ව්‍යාපෘති ආරම්භ කර නොමැත. ඒ අනුව යටිතල පහසුකම් සංවර්ධනය සඳහා මේ වන විට අධිකාරිය කටයුතු කරමින් සිටි. එසේම බි, සි, ඊ, එච්, වලව, හුරුළුවැව කලාපවල ආයෝජන ව්‍යාපෘති පිළිබඳ විස්තර ඉදිරිපත් කර ඇත. | |
| (ඇ) | 1947 අංක 08 දරන රජයේ ඉඩම් ආඥා පනතේ 199(3) ඡේදය ප්‍රකාරව රජයේ ඉඩම් පිළිබඳ සෑම වරණීය බද්දකටම රජයේ ඉඩම් ආඥා පනත යටතේ පනවන ලද 21(1) රෙගුලාසිය යටතේ අමාත්‍යවරයාගේ පූර්ව ලිඛිත අනුමැතිය ලබා ගත යුතු වුවත් පූර්ව ලිඛිත අනුමැතියකින් තොරව රඹකැන් ඔය කලාපයේ ඉඩම් අක්කර 3,750 ක භුක්තිය ආයෝජකයින් හත්දෙනෙකු වෙත භාරදීමට අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලබා දී තිබුණි. එසේම මෙම ඉඩම්වල භුක්තිය භාරදීමට ප්‍රථම කිසිදු පාරිසරික බලපෑම් ඇගයීමක් සිදුකර නොතිබුණි. තවද මෙම ඉඩම් සඳහා තරඟකාරී හා විනිවිදභාවයකින් යුතුව අයදුම් පත් කැඳවීමකින් තොරව | රඹකැන්ඔය කලාපය ආයොජකයින් හතර දෙනෙකු වෙත අක්කර 1250 ක් පමණ රාජ්‍ය ප්‍රතිපත්තින් අනුව ආනයනික ආහාර බෝග නිෂ්පාදන ඉලක්ක සපුරා ගැනිම සඳහා ජාතික ආහාර නිෂ්පාදන කාර්ය සාධන කමිටුව හා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත අධ්‍යක්ෂ ජනාරාල්වරයා විසින් තාවකාලිකව කන්නයක් සඳහා බදු දිම සිදු කර ඇත. බදු දිමෙන් අනතුරුව ඇති වූ මහජන විරෝධතා හේතුවෙන් අදාල ඉඩම් කොටස් සංවර්ධනය කිරිමට බාධා ඇති විය. එබැවින් මෙම ඉඩම් කොටස් බදු දිම සඳහා අනුමැතිය ලබා ගැනිමට අමාත්‍ය මණ්ඩලය වෙත සංදේශයක් ඉදිරිපත් කරන ලද | වාණිජ කටයුතු සඳහා ඉඩම් බැහැර කිරිමේදී තරඟකාරී හා විනිවිදභාවයකින් අයදුම්කරුවන් තෝරාගත යුතු අතර වරණීය පදනමට ඉඩම් ලබාදීමේදී රජයේ ඉඩම් ආඥා පනතේ 199 හා 206 ඡේද ප්‍රකාරව කටයුතු කළ යුතුය . |

| | |
|---|---|
| ජාතික ආහාර නිෂ්පාදන කාර්යසාධන කමිටුව වෙත යොමුකර ආයෝජකයින්ගෙන් අයදුම්පත් ලබාගෙන තිබුණි. 1947 අංක 08 දරන රජයේ ඉඩම් ආඥා පනතේ 199(4) ඡේදය ප්‍රකාරව අමාත්‍යවරයා විසින් වෙනත් ආකාරයට නියෝග කර ඇත්නම් මිස වරණීය ප්‍රදාන පත්‍රයක් හෝ බදුකරයක් නිකුත් කිරීමට අදහස් කරන සෑම විටකම ඒ පිළිබඳ නිවේදනයක් 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ ගැසට් පත්‍රයේ පල කල යුතු වුවත් එසේ සිදුකර නොතිබුණි. ඉඩම් බැහැර කිරීමට විරුද්ධව බාහිර පාර්ශව විසින් අධිකරණ ක්‍රියාමාර්ග ගැනීම හේතුවෙන් ආයෝජන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමටද නොහැකි වී තිබුණි. | අතර එහිදී මෙම ඉඩම් ආයොජකයන්ට ලබා දිමට ප්‍රථම පාරිසරික ඇගයිමක් ඇතුළුව මුලික වගා වැඩසටහන ක්‍රියාත්මක කිරිම මඟින් ලබා ගත් ප්‍රතිඵල සම්බන්ධයෙන් සවිස්තර වාර්තාවක් සලකා බැලිම පිණිස ඇමති තුමා මඟින් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලෙස උපදෙස් ලබා දී ඇත. ඒ අනුව රඹකැන්ඔය කලාපයෙන් මෙම ආයෝජකයින් 7 දෙනා වෙත දිර්ඝකාලීන බදු පදනම යටතේ ඉඩම් ලබා දි නොමැත. ඉඩම් ලබා දිමේ ක්‍රමවේදය විධිමත් කිරිම. අධිකාරිය සතු විශේෂ ප්‍රදේශ වල ඉඩම් බැහැර කිරිම සම්බන්ධයෙන් වාරිමාර්ග අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛ අංක 1/2021 මඟින් රජයේ ඉඩම් බැහැර කිරිමේදී අනුගමනය කල යුතු ක්‍රියාවලිය විධිමත් කිරිම සම්බන්ධයෙන් සියළුම නේවාසික ව්‍යාපර කළමනාකරුවන් සහ ඉඩම් බැහැර කිරිම සම්බන්ධයෙන් කටයුතු කරන අංශ දැනුවත් කිරිමට කටයුතු කර ඇත. ඒ අනුව රජයේ ඉඩම් අඥා පනත යටතේ සහ ඉඩම් සංවර්ධන අඥා පනත යටතේ මහවැලි අධිකාරිය විසින් ඉඩම් ලබා දිමේ ක්‍රමවේදය විනිවිදභාවයකින් හා විධිමත්භාවයකින් සිදු කිරිම සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදුකර ඇත. |

## 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපළ, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතිය මඟින් රු.339,584,727 ක වියදමින් ඉදිකර 2019 වර්ෂයේ අධිකාරියට භාරදී තිබුණු පොල්ගොල්ල ජලාශ පාලන මධ්‍යස්ථාන ගොඩනැගිල්ල මහල් 02 කින් සමන්විත වුවද, ප්‍රමාණවත් පරිදි කාර්ය මණ්ඩලයක් එහි අනුයුක්ත කර නොතිබුණු බැවින්, එම ගොඩනැගිල්ල ඌන උපයෝජිතව පැවතුණි. | මෙම මධ්‍යස්ථානය 2018 ජූනි මස සිට පොල්ගොල්ල කාර්යභාර ඉංජිනේරුවරයාගේ අධීක්ෂණය හා විදුලි ඉංජිනේරුවරියකගේ පාලනය යටතේ ක්‍රියාත්මක වන අතර, ගංවතුර පාලන සම්බන්ධීකරණය, සියළු වේලි අධීක්ෂණය හා ආරක්ෂණ කටයුතු, සම්මන්ත්‍රණ හා විවිධ රැස්වීම් පැවැත්වීම ආදී කටයුතු සඳහා දැනට භාවිතා කරනු ලබයි. විශේෂයෙන් සෑම | ගොඩනැගිල්ල පූර්ණ වශයෙන් භාවිතයට ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

| | | |
|---|---|---|
| | | වර්ෂයකම අග භාගයේ, එනම් නොවැම්බර්, දෙසැම්බර් මාසවලදීත් කාළගුණික විපර්යාස හේතුවෙන් අවිනිශ්චිත ලෙස ඇති වන අධික වර්ෂාපතනය නිසාත් ඇති වන ගංවතුර තත්වයන් පාලනය කිරීම සඳහා සියළුම ජලාශ පද්ධතීන් සමඟ අවශ්‍ය මෙහෙයුම් සම්බන්ධීකරණය. 2020 වර්ෂයේ මුල් කාලයේ සිට **Covid – 19** වසංගත රෝග ව්‍යාප්තිය පාලනය තත්වය යටතේ විශාල වේලි සඳහා වූ අන්තර් ජාතික කොමිසම **(ICOLD)** ආයතනය මඟින් පවත්වනු ලබන ජාත්‍යන්තර සම්මන්ත්‍රණ සඳහා **Zoom** තාක්‍ෂණය මඟින් ඉංජිනේරුවරුන් සහභාගී කරවීම, තත්කාලීන කාලගුණික දත්ත, ජලාශ වල ජල මට්ටම් හා ධාරිතාව ඇතුලත් දත්ත, වේලි ආරක්‍ෂණ සඳහා සවිකර ඇති උපකරණ වල දත්ත ආදිය කාර්යභාර ඉංජිනේරු කාර්යාල සමඟ සම්බන්ධීකරණය කරයි. කෙසේ නමුත්, මෙම ගොඩනැගිල්ලට කාර්ය මණ්ඩලය අනුයුක්ත කිරීම සඳහා යාබද ගොඩනැගිල්ල නිදහස් කිරීම පිණිස මධ්‍යම පරිසර අධිකාරිය වෙත නිරන්තරව දැනුම් දුන්නද, එම ගොඩනැගිල්ල නිදහස් නොකිරීම හේතුවෙන්, දිගන කාර්යාලයේ කාර්ය මණ්ඩලය මේ සඳහා අනුයුක්ත කිරීමට නොහැකිව ඇත. |

**3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අධිකාරිය විසින් රු.3,386,358 කට රන්ටැඹේ කාර්යභාර ඉංජිනේරු කාර්යාලය අලුත්වැඩියා කිරීම සඳහා ගිවිසුම් ගත වී තිබුණද ගිවිසුම් කාලය තුල වැඩ අවසන් කර නොතිබුණි. අවස්ථා 08 කදී කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර තිබුණද වැඩ අවසන් නොකිරීම හේතුවෙන් කොන්ත්‍රාත්තුව | කොන්ත්‍රාත්තුවට අදාල රු.169,318 වටිනා කාර්යසාධන ඇපකර මුදල අයකර ගැනීම සඳහා කළමනාකාර, මහජන බැංකුව වෙත ලිඛිතව දැනුම් දී අය කර ගැනීමට කටයුතු කර ඇත. එලෙසම මෙම කොන්ත්‍රාත්තුවට අදාල අත්තිකාරම් ඇපකරය වන රු. 1,015,907 මුදල | කළ වැඩ ඉක්මවා වැඩිපුර ගෙවා ඇති මුදල් අයකර ගැනීමට පියවර ගත යුතු අතර ගොඩනැගිල්ල අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට අවශ්‍ය පියවර ගත |

| | | | |
|---|---|---|---|
| | අත්හිටුවා තිබුණි. නමුත් කොන්ත්‍රාත්තුවට අදාලව රු.169,318 ක් වටිනා කාර්යසාධන ඇපකරයේ හා රු.1,015,907 ක් වටිනා අත්තිකාරම් ඇපකරයේ මුදල් අයකරගෙන නොතිබුණි. මේ හේතුවෙන් කල වැඩ ඉක්මවා ගෙවීම් කර තිබුණු රු.949,015 මුදල අයකරගැනීම සඳහා නෛතික ක්‍රියාමාර්ග ගැනීමට සිදු වී තිබුණි. ඉතිරි වැඩ ප්‍රමාණය ඇස්තමේන්තු කර නව කොන්ත්‍රාත්කරුවෙකුට ලබාදීමට හෝ සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් මෙම කාර්යාල ගොඩනැගිල්ල භාවිතයට ගත නොහැකිව පැවතුණි. | අය කර ගැනීම සඳහා කළමනාකාර, මහජන බැංකුව වෙත ලිඛිතව දන්වා ඇත. කොන්ත්‍රාත්කරුගෙන් මුදල් අයකර ගැනීම සඳහා නීතිමය පියවර ගැනීමටද කටයුතු කර ඇත. තවද, මෙම කොන්ත්‍රාත්තුව අවසන් කර කොන්ත්‍රාත්තුව සඳහා වැඩ කරන ලද කොටස් සඳහා ගෙවීම් නතර කිරීමට කටයුතු කර ඇත. කොන්ත්‍රාත්කරුගෙන් අදාල මුදල් අයකිරීමෙන් අනතුරුව ඉතිරි වැඩ කොටස් සඳහා 2021 වර්ෂය තුල වෙනත් කොන්ත්‍රාත්තුවක් මඟින් ඉටුකර ගැනීමට සැලසුම් කර ඇත. | යුතුය. |
| (ආ) | කොන්ත්‍රාත් වටිනාකම රු.2,376,972 ක් වූ මහවැලි ආරක්ෂක බළකා නිල නිවාස අලුත්වැඩියා කොන්ත්‍රාත්තුව සඳහා තෝරාගත් කොන්ත්‍රාත්කරු වෙත 2020 ජනවාරි 30 දින ප්‍රතිග්‍රාහක ලිපි යවා තිබුණද එදින සිට දින 14 ක් ඇතුලත වැඩ ආරම්භකල යුතු වුවත් එපරිදි වැඩ ආරම්භකර නොතිබුණි. පසුව වර්ෂයකට අධික කාලයක් ගත වීමෙන් පසු අධිකාරිය විසින් 2021 පෙබරවාරි 17 දින එම කොන්ත්‍රාත් ප්‍රදානය අවලංගු කර තිබුණි. අලුත්වැඩියා කටයුතු නොකිරීම හේතුවෙන් මෙම නිල නිවාස තවදුරටත් අබලන් වෙමින් භාවිතයට නුසුදුසු තත්ත්වයට පත්වෙමින් තිබුණි. | මගේ අංක DDG/CON/MSO/DIG/B3 හා 2021 පෙබරවාරි 17 දිනැති ලිපිය මඟින්, අදාල කොන්ත්‍රාත් ප්‍රදානය අවලංගු කර ඇත. එස්.එස්.පි.ඉංජිනියර්ස් ලිමිටඩ් වෙත ගෙවීමට තිබූ අංක DDG/CON/MSO/DIG/B/04 කොන්ත්‍රාත්තුවේ අවසන් ගෙවීම් කලයුතු මුදලින් අදාල ලංසු සුරක්ෂණ ගාස්තු රු: 35,000 ක් අයකර ගන්නා ලදී. ඉදිරි වර්ෂයේ යෝජිත ප්‍රතිපාදන අනුව අළුත්වැඩියා කටයුතු කිරීමට සැලසුම් කර ඇත. | ප්‍රතිග්‍රහණ ලිපිය ප්‍රකාරව වැඩ ආරම්භ නොකරන්නේනම් අදාල පිරිනැමීම අවලංගු කල යුතු අතර වෙනත් කොන්ත්‍රාත්කරුවෙකු වෙත ලබා දී අදාල අළුත්වැඩියා කටයුතු සිදුකිරීමට පියවර ගත යුතුය. |
| (ඇ) | කොත්මලේ කාර්යභාර ඉංජිනේරු කාර්යාලයේ පවතින නැරඹුම් මැදිරිය ප්‍රතිසංස්කරණය කිරීම සහ පැරණි වේලි ආදර්ශනය ඉවත්කර නව වේලි ආදර්ශනයක් සැකසීම සඳහා 2017 වර්ෂයේ රු.6,990,000 කට කොන්ත්‍රාත්තුවක් පිරිනමා තිබුණු අතර ඉන් රු.2,060,000 ක ඇස්තමේන්තුවක් සහිත වේලි ආදර්ශනය දෝෂ සහිතව සහ අඩු ගුණත්වයෙන් යුතුව සකසා තිබුණි. කොන්ත්‍රාත් පිරිනැමීමේදී කාර්යසාධන ඇපකරයක් ලබා ගෙන නොතිබීම නිසා ගිවිසුම් ප්‍රකාරව කාර්යය නිමනොකිරීම | මෙම කොන්ත්‍රාත්තුව නැරඹුම් මැදිරිය ප්‍රතිසංස්කරණය හා නවීකරණය කොත්මලේ ජලාශයේ සියළුම අංග හා විශේෂාංග සුදුසු පරිමාණ වලට අනුගතව තාත්වික වේලි ආදර්ශයක් පවතින ඉඩ ප්‍රමාණය තුල නිර්මාණය කිරීම ලෙස ප්‍රධාන වශයෙන් කොටස් දෙකක් වේ. මෙම කොටස් දෙකෙන් පළමු කොටස කොන්ත්‍රාත්කරු විසින් සාර්ථකව නිම කළ නිසා ඒ සඳහා අදාල මුදල ගෙවන ලදි. වේලි ආදර්ශනයේ දෝෂ හා අඩු ගුණාත්මකභාවය පිළිබඳ කාර්යභාර ඉංජිනේරු විසින් වාචිකව හා ලිඛිතව | ඉදිකිරීම් කොන්ත්‍රාත් ගිවිසුම් ප්‍රකාරව ප්‍රමිතියෙන් යුතුව සිදුකිරීම හා ගිවිසුම් කඩකිරීම් මත සිදුවන පාඩු ආවරණය කරගත හැකි පරිදි කාර්යසාධන සුරක්ෂණ ලබාගැනීමට පියවර ගත යුතුය. |

| | | |
|---|---|---|
| | නිසා අධිකාරියට වූ පාඩු අයකර ගත නොහැකි වී තිබුණි. | අවස්ථා කිහිපයකදීම කොන්ත්‍රාත්කරු දැනුවත් කල ද කිසිදු යහපත් ප්‍රතිචාරයක් නොලැබිණි. ඒ අනුව මෙම දෝෂ සහිත වේලි ආදර්ශණය ප්‍රතික්ෂේප කල අතර ඒ සඳහා කිසිදු මුදලක් නොගෙවන ලදි. එම ආදර්ශනය නැරඹුම් මැදිරියට පැමිණෙන නරඹන්නන් සඳහා ප්‍රදර්ශනයට සුදුසු තත්වයක නොමැති බැවින් මෙය නැරඹුම් මැදිරියෙන් ඉවත් කර ගන්නා ලෙස කොන්ත්‍රාත් කරුට දන්වා ඇති නමුත් මේ වන තෙක් එය ඉවත් කරගෙන නොමැත. මේ සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට යොමු කර ඇත. |

**3.5 මානව සම්පත් කළමනාකරණය**
**--------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණ<br>------------------- | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම<br>---------------------------------- | නිර්දේශය<br>------------ |
|---|---|---|---|
| (අ) | මහවැලි ආරක්ෂක බලකායට අයත් නිළධාරීන් 25 ක් වෙනත් බාහිර ආයතනවල සේවයේ නියුක්තව සිටින අතර එම නිළධාරීන් වෙනුවෙන් ගෙවා තිබුණු වැටුප් රු.6,187,072 ක් එම ආයතනවලින් ප්‍රතිපූරණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් හා වාරිමාර්ග අමාත්‍යාංශය විසින් කරන ලද ඉල්ලීම සලකා බලා ආරක්ෂක භටයින් වෙනත් අමාත්‍යාංශ හා සේවා ස්ථාන සඳහා අනුයුක්ත කිරිම් කර ඇත. නමුත් එම නිලධාරින්ගේ වැටුප් අධිකාරිය මගින් ගෙවීම් කල ද එම මුදල් ප්‍රතිපූර්ණය කර ගැනීම සඳහා මේ වන විට පියවර ගෙන ඇත. | අදාල ගෙවීම් ප්‍රතිපූරණය කර ගැනීමට කටයුතු කළයුතුය. |
| (ආ) | 2020 දෙසැම්බර් 31 දිනට මහවැලි ආරක්ෂක බලකායේ තනතුරු 4 ක නිළධාරීන් 15 දෙනෙකුගේ අතිරික්තයක්ද තනතුරු 7 ක නිළධාරීන් 77 දෙනෙකුගේ පුරප්පාඩුද පැවතුණි. තවද මහවැලි ආරක්ෂක බළකායට අයත් ආරක්ෂක නියාමකවරුන් 11 දෙනෙකු අනුබණ්ඩයන්ට අනුයුක්ත නොකර ආරක්ෂක රාජකාරී වෙනුවට දිගන මහවැලි ආරක්ෂක බලකා ප්‍රධාන කාර්යාලයේ රාජකාරීවල නිරතවී තිබුණි. | මහවැලි ආරක්ෂක බලකාය සඳහා අනුමත සේවක සංඛ්‍යාවක් පැවතිය ද එම සේවක සංඛ්‍යාව අනුමතකරන අවස්ථාවේ දී පැවති සේවක අවශ්‍යතාවයට අමතරව මේ වන විට වඩා නිලධාරින්ගේ අවශ්‍යතාවයක් ඇත. එසේම ඉංජිනේරු සහකාර තනතුර මහවැලි ආරක්ෂක බලකාය වෙත අනුමතව වී නොමැති වුවද එම බලකායේ අනුබණ්ඩ හා බලප්‍රදේශ කාර්යාල හා නිල නිවාස හා ගොඩනැගිලිවල නඩත්තු කාර්යයන් සම්බන්ධයෙන් ඉංජිනේරු සහකාරවරයෙකුගේ අවශ්‍යතාවයන් පැන නැගුන බැවින් අනුයුත්ක කර ඇත. | අනුමත සේවක සංඛ්‍යාව අවශ්‍ය පරිදි සංශෝධනය කර ගත යුතු අතර අනුමත තනතුරු සඳහා අදාල නිළධාරීන් සේවා නියුක්ත කළ යුතුය. |

එසේම ප්‍රාදේශීය කළමනාකාර තනතුරු දෙක 2011 අගෝස්තු 22 දින අනුමත කර ඇති අධිකාරියේ සේවක සංඛ්‍යාවට ඇතුළත් නොවුන ද ඒ වන විට සේවය කරමින් සිටි ප්‍රාදේශීය කළමනාකරුවන් දෙදෙනා ඔවුනට පමණක් පෞද්ගලික වන සේ එම තනතුරේම තැබීමට කටයුතු කර ඇත. තවද අරක්කැමි තනතුර විශේෂයෙන් ආරක්ෂක අංශයට ඇතුලත් නොවුවද ප්‍රධාන වේලි හා ජලාශ මෙහෙයුම් අංශය යටතේ ආරක්ෂක සේවාවන් සපයන භට පිරිසෙහි ආහාර පාන සැකසීමේ කටයුතු මෙම සේවකයින් තුලින් ඉටු කර ගැනීමට කටයුතු කර ඇත. රියදුරන් හා ආරක්ෂක නියාමක තනතුරු දෙක බඳවා ගැනීම් සිදු නොකිරීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් උපදෙස් ලැබී ඇත.